1. මේ වාක්‍යවල කරණ විභක්ති අර්ථ ගත් පද යටින් ඉරක් අඳින්න.

   i. දැරිය තුවායෙන් මුහුණ පිසදමයි.
   ii. ඒ මේසය තේක්ක ලීයෙන් නිමවූවකි.
   iii. මුදු දහමින් ලෝ සතුන් සිත සැනසේ.

2. කරණ විභක්ති ගත් පද සහිත වාක්‍ය පහක් ලියන්න.

අභ්‍යාස

1. තද කළු අකුරින් මුද්‍රිත පදවල විභක්ති අර්ථ නම් කරන්න.

   i. වෙළෙන්දා වළවුව විකිණීමෙන් ධනවත් විය.
   ii. මා විසින් ඉදිරිපත් කරන ලද රචනයට ප්‍රථම ස්ථානය ලැබිණි.
   iii. ගං තෙරදී මිතුරෝ දිය නෑමට සූදානම් වූහ.
   iv. මැතිමහත්තු කොඩි රැගෙන පෙරහැරේ යති.
   v. මීමැස්සෝ මලින් මලට පියඹා රොන් පැණි රැස් කරති.
   vi. ළමයින් විසින් මල් වලින් සරසන ලදී.
   vii. අධික වර්ෂාවෙන් ගොවිතැන් කටයුතුවලට මහත් අලාභ හානි සිදු විය.
   viii. අපි අභය භූමියේ දී කුරුළු පැටවුන් දුටුවෙමු.

      i. විකිණීමෙන් -
      ii. මා විසින් -
      iii. මිතුරෝ -
      iv. කොඩි -